කොවිඩ්-19 ආසාදිතයන් සහ ආශ්‍රිතයන් පිළිබඳව වන පුවත් ඉදිරිපත් කිරීමේදී, ඔවුන් පිළිබඳව සමාජය තුළ ගර්හාත්මක හෝ කොන් කිරීමේ ආකල්පයක් ඇති නොවන ලෙසින් පුවත් වාර්තාවන් ඉදිරිපත් කිරීමත්, කොවිඩ්-19 රෝගීන්ගේ පුද්ගල ගරුත්වය ආරක්ෂා කිරීමත් ආචාර ධාර්මික සහ වගකීම් සහගත මාධ්‍යකරණයයි.

නමුත්, තවමත් එම වගකීම ඉටු නොකරන මාධ්‍ය වාර්තාවන් දක්නට ලැබීම සැබවින්ම කණගාටුවට කරුණකි. ඊට උදාහරණ ලෙසින් "කොරෝනා බිලිඳිය", "කොරෝනා මව" වැනි යෙදුම් සහිත සිරස්තල පෙන්වා දිය හැක.

මෙවැනි යෙදුම් කෙතරම් දුරට ජනමාධ්‍ය ආචාර ධර්මයන්ට අනුගත වන්නේද? මාධ්‍ය තවමත් මෙවැනි යෙදුම් භාවිතා කිරීම පිළිබඳ ඔබේ අදහස කුමක්ද?

**#MediaEthicsSL #lka #sinhalanews #Lankadeepa**